

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යංශය

ජාතික අයවැය

2025 පුරවැසි අයවැය

වාර්ෂික අයවැයෙහි ජනතා හිතවාදී අනුවාදයක්

පෙබරවාරි 2025

2025
වර්ෂය සඳහා
අයවැය
සකස් කිරීමේ පදනම





වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148-152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව) ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවයකි. 2025 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට, 2025 වර්ෂය තුළ එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ආයතනයට අදාළ වැය සීමාවන් සමඟ මෙම ව්‍යදම් දැරීම සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ යෝජිත මාධ්‍යයන් ඇතුළත් වන අතර එය ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ආකෘතිය සාමාන්‍ය ජනතාව හට සංකීර්ණ බවක් පෙන්නුම් කරයි.

එබැවින්, රාජ්‍ය අයවැයේ අන්තර්ගත තොරතුරු වඩාත් සරල හා අඩු පාරිභාෂික බවකින් යුතුව බෙදා හැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදහස් කර ඇත. තවද, වාර්ෂික අයවැයේ ප්‍රධාන කරුණු විනිවිදභාවයකින් යුතුව හා පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි සාරාංශගත කර මහජන හිතකාමී අනුවාදයක් ලෙස ඉදිරිපත් කළ යුතු බවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20 වැනි වගන්තියේ සඳහන් වේ. මෙහිදී, සියලුම පුරවැසියන් සහ බදු ගෙවන්නන් හට, බදු ආදායම් වියදම් කරන ආකාරය සහ සම්පත් ප්‍රශස්ත ආකාරයකින් වෙන් කිරීමේදී රජයේ ප්‍රමුඛතා කවරේදැයි වඩා හොඳින් අවබෝධ කර ගත හැකි වනු ඇති අතර, මෙම ප්‍රවේශය තුළින් සම්පත් වෙන් කිරීම සහ එය කාර්යක්ෂමව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමට මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වැය දරන ආයතන ප්‍රධානීන් විසින් ලබා දෙන ලද ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම වෙනුවට, මෙම ප්‍රකාශනය මඟින් අංශ අනුව ප්‍රධාන ව්‍යාපෘති / වැඩසටහන් සඳහා රජයේ වියදම් පිළිබඳ තොරතුරු සැකෙවින් සපයනු ලැබේ. තව ද, ණය සේවාකරණය සහ හදිසි සේවා සඳහා වන ප්‍රතිපාදන මෙම අංශ යටතේ නොසැලකේ. පරිශීලනය කිරීමේ පහසුව සඳහා ආංශික එකතුවෙහි රුපියල් අගයන් ආසන්නතම බිලියනයට වටයා ඇති බැවින්, ගිණුම්කරණ ආකෘතියේ සංඛ්‍යා සමඟ සැසඳීමේදී සුළු විෂමතා ඇතිවිය හැකිය.

එසේම, 2025 අයවැය කතාවෙන් පසුව අයවැය යෝජනා ද ඇතුළත් කරමින් මෙම පුරවැසි අයවැය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. මෙම ලේඛනය මෙරට දෘෂ්‍යාබාධිත පුද්ගලයින් හට ප්‍රවේශ විය හැකි පරිදි ඒකකේත (යුනිකෝඩ්) අකුරු වලින් ද ප්‍රකාශයට පත් කර ඇත.

2025 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමේ පදනම

රජය විසින් යම් මූල්‍ය වර්ෂයක් තුළ දැරීමට නියමිත වියදම් සඳහා බලය පැවරීම, එම වර්ෂය තුළ රජයේ ණය ගැනීම් සඳහා බලය පැවරීම සහ වර්ෂය තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා යම් විධිවිධාන සැලසීම පිණිස පාර්ලිමේන්තුව විසින් සෑම වසරකම විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී.

- පොහොසත් රටක් ලස්සන ජීවිතයක් - වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය
- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ පහත දැක්වෙන දිශානතීන්
  - අදාළ මූල්‍ය වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික දළ දේශීය නිෂ්පාදිතයෙන් 13% නොඉක්මවන පරිදි රජයේ ප්‍රාථමික වියදම පවත්වාගත යුතුය. (පනතේ 15 වැනි වගන්තිය)
  - වාර්ෂික අයවැය සංචිතය, ප්‍රාථමික වියදමේ යෝජිත ඇස්තමේන්තුවෙන් සියයට දෙකක් නොඉක්මවිය යුතුය. (පනතේ 25 වැනි වගන්තිය)

මධ්‍ය කාලීන සාර්ව ආර්ථික - මූල්‍ය රාමුව 2023-2028 — **ද.දේ.නි.යෙන් %ක් ලෙස**

දර්ශකය	2023 (තත්‍ය)	2024 (තාවකාලික)	පුරෝකතන 2025	2026	2027	2028
සමස්ත ආදායම හා ප්‍රදාන	11.1	13.6	15.1	15.1	15.2	15.3
සමස්ත ආදායම	11.0	13.4	15.0	15.0	15.1	15.2
බදු ආදායම	9.8	12.3	13.9	13.9	13.9	14.2
බදු නොවන ආදායම	1.2	1.1	1.1	1.1	1.1	1.1
සමස්ත වියදම	19.4	20.4	21.8	19.6	19.1	19.0
පුනරාවර්තන වියදම	17.0	17.8	17.8	15.5	15.0	14.8
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	2.4	2.6	4.0	4.1	4.1	4.2
ජංගම ගිණුම් ශේෂය	-6.0	-4.4	-2.8	-0.5	0.1	0.4
ප්‍රාථමික ශේෂය	0.6	2.2	2.3	2.3	2.3	2.4
අයවැය හිඟය	-8.3	-6.8	-6.7	-4.5	-4.0	-3.7

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආදායම සහ වියදම



රාජ්‍ය ආදායම

රජයේ ආදායම බදු, බදු නොවන සහ ප්‍රදාන වලින් ලැබෙන ආදායමෙන් සමන්විත වන අතර 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු ආදායම සහ ප්‍රදාන රු. බිලියන 4,990 කි. එයින් බදු ආදායම, බදු නොවන ආදායම සහ ප්‍රදාන පිළිවෙලින් රු. බිලියන 4,590 ක්, රු. බිලියන 370 ක් සහ රු. බිලියන 30 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. බදු ආදායම ප්‍රධාන වශයෙන් ආදායම් බදු, වැට් බදු, බාහිර වෙළඳාම සඳහා බදු සහ සුරාබදු වලින් සමන්විත වන අතර බදු නොවන ආදායම ප්‍රධාන වශයෙන් ගාස්තු සහ අයකිරීම්, ලාභාංශ, ලාභ සහ කුලී ආදායමෙන් සමන්විත වේ.



රාජ්‍ය වියදම

ණය සේවාකරණය ඇතුළුව 2025 වර්ෂය සඳහා රජයේ වියදම රුපියල් බිලියන 8,835 ක් වන අතර, එයින් රුපියල් බිලියන 4,550 ක් ණය සේවාකරණය සඳහා වෙන් කර ඇත. ණය පොලී ගෙවීම් සඳහා වන රුපියල් බිලියන 2,950 ක් සහ ණය ආපසු ගෙවීමට අදාළ රුපියල් බිලියන 1,600 ක් ද ඊට ඇතුළත් වේ. තව ද, ප්‍රාථමික පිරිවැය රුපියල් බිලියන 4,285 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

ප්‍රාථමික වියදමෙහි, වැටුප් හා වේතන (රු. බිලියන 1,232), විශ්‍රාම වැටුප් (රු. බිලියන.431), අස්වැසුම (රු. බිලියන.233), වෙනත් පුනරාවර්තන (රු. බිලියන. 1,073) හා ප්‍රාග්ධන වියදම් (රු. බිලියන 1,315) අන්තර්ගත වේ.

සවිස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල සහ පුරවැසි අයවැයෙහි ව්‍යුහය

2025 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු තුළ කැබිනට් අමාත්‍යාංශ 24 ක්, දෙපාර්තමේන්තු 134 ක් සහ විශේෂ වියදම් ඒකක 21 ක් යටතේ වියදම් අන්තර්ගත වේ. පුරවැසියන් හට මහජන හිතකාමී සංස්කරණයක් ඉදිරිපත් කිරීමේ අරමුණින් පුරවැසි අයවැය මඟින් සියලුම වියදම් අංශ 12කට සාරාංශගත කොට ඇත. තවද, වැඩි විස්තර සඳහා එක් එක් වැය ශීර්ෂයෙන් උපුටා ගන්නා ලද ඩිජිටල්කරණය, නඩත්තු කටයුතු, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සහ පර්යේෂණ හා සංවර්ධනය වැනි පොදු විෂයයන් මෙම ලේඛනයේ අවසාන කොටසේ වැඩිදුර තොරතුරු සඳහා ඉදිරිපත් කර ඇත.



2025 අයවැයෙහි සංක්ෂිප්තය

රුපියල් බිලියන 604	සුවපත් සමාජයක් සඳහා නිරෝගි දිවි පෙවෙතක්
රුපියල් බිලියන 619	අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාවය හා විශිෂ්ටත්වය ළඟාකර ගැනීම
රුපියල් බිලියන 483	ආරක්ෂිත, කාර්යක්ෂම,පරිසර හිතකාමී සහ තිරසාර ප්‍රවාහන සේවයක්
රුපියල් බිලියන 190	යහපත්, සුවපහසු දිවියක් ගත කිරීමේ අපේක්ෂාවට සහාය වීම
රුපියල් බිලියන 254	රටෙහි ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී, නවීකරණය කරන ලද තිරසාර කෘෂිකර්මයක්
රුපියල් බිලියන 44	සදාහරිත ජීවිතයක් සඳහා සහාය දීම
රුපියල් බිලියන 278	සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා සහාය දීම
රුපියල් බිලියන 404	ජාතික ආරක්ෂාව
රුපියල් බිලියන 99	ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය
රුපියල් බිලියන 21	තිරසාර සහ ආරක්ෂිත බලශක්ති සැපයුම
රුපියල් බිලියන 296	ජනතා හිතවාදී රාජ්‍ය සේවයක්
රුපියල් බිලියන 749	සියල්ලන්ම ආවරණය වන සමාජ ආරක්ෂණ පද්ධතියක්

සුවපත්
සමාජයක්
සඳහා නිරෝගී
දිවි පෙවෙතක්



දිවයින පුරා පිහිටි රෝහල් ජාලය

ජාතික රෝහල් 03 ක්, ශික්ෂණ රෝහල් 11ක්, විශේෂිත රෝහල් 18ක්, දිස්ත්‍රික් මහ රෝහල් 20 ක්, මූලික රෝහල් 80 ක්, ප්‍රාදේශීය රෝහල් 486 ක්, ප්‍රාථමික වෛද්‍ය සේවා මධ්‍යස්ථාන 545 ක් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 356 ක් ක්‍රියාත්මක කිරීම මඟින් සෞඛ්‍ය සේවා සැපයීම.

සෞඛ්‍ය ආශ්‍රිත ආයතන තුළ වෛද්‍යවරුන් 23,936 ක්, හෙදියන් 38,969 ක්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් 8,646 ක්, සෞඛ්‍ය උපස්ථායක කාර්යය මණ්ඩලය 35,405 ක්, රසායනාගාර තාක්ෂණවේදීන් 2,068 ක් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 2,123 ක් සේවයේ යෙදවීම.

2025 වර්ෂය සඳහා රු. බිලියන 604

පුනරාවර්තන වියදම් රු. බිලියන **496.3**

ප්‍රාග්ධන වියදම් රු. බිලියන **107.3**

රු. බිලියන 39.9
රෝහල් සංවර්ධනය

රු. බිලියන 319.9
රෝහල් මෙහෙයුම්

රු. බිලියන 5.8
දේශීය වෛද්‍ය පහසුකම් සංවර්ධනය

රු. බිලියන 185
වෛද්‍ය සැපයුම්

රු. බිලියන 12.5
ත්‍රිපෝෂ ඇතුළු පෝෂණ වැඩසටහන්

රු. බිලියන 12.5
රෝග වැළැක්වීමේ ක්‍රමවේද

රු. බිලියන 0.9
සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධනය

රු. බිලියන 22.4
සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

රු. බිලියන 4.9
සුවසැරිය ගිලන්රථ සේවාව

ප්‍රධාන වියදම් සංරචක

රෝහල් මෙහෙයුම් කටයුතු

- සෞඛ්‍ය අංශයේ පුද්ගල පඩිනඩි - රු. බිලියන **210.6**
- මධ්‍යම රජයේ සහ පළාත් සභාවල ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) - රු. බිලියන **12.2**
- සෞඛ්‍ය පද්ධතිය නඟා සිටුවීම - රු. බිලියන **9.3**
- රෝහල් වෙත ආහාර සහ නිල ඇඳුම් සැපයීම - රු. බිලියන **7.2**

වෛද්‍ය සැපයුම් සහ ජෙව-වෛද්‍ය උපකරණ

- රෝහල්වල වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම - රු. බිලියන **183.8**
- ජෙව වෛද්‍ය උපකරණ සැපයීම - රු. බිලියන **13.3**

රෝග වැළැක්වීමේ ප්‍රවේශයන්

- සෞඛ්‍ය සේවා තොරතුරු සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම - රු. බිලියන **6.6**
- බෝවන සහ බෝ නොවන රෝග නිවාරණය සහ පාලනය කිරීම - රු. බිලියන **1.4**

පුහුණු

- වෛද්‍යවරුන්ගේ පශ්චාත් උපාධි පුහුණු වැඩසටහන් - රු. බිලියන **2.0**


රෝහල් ඉදිකිරීම්

- හලාවත, අම්පාර, කෑගල්ල, මහනුවර, ත්‍රිකුණාමලය රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක ගොඩනැඟිලි ඉදිකිරීම - රු. බිලියන **1.5**
- රත්නපුර ශික්ෂණ රෝහලේ නව පිළිකාවේදී ඒකකයක් ඉදිකිරීම - රු. බිලියන **0.25**
- මහනුවර ශික්ෂණ රෝහලේ පිළිකා මධ්‍යස්ථානයක් ඉදිකිරීම - රු. බිලියන **0.6**
- රත්නපුර හෘද සත්කාරක සංකීර්ණය ඉදිකිරීම - රු. බිලියන **0.4**
- කරාපිටිය ශික්ෂණ රෝහලේ ශල්‍ය වෛද්‍ය ඒකකයක් ඉදිකිරීම -රු. බිලියන **0.45**

සෞඛ්‍ය අංශයේ ප්‍රධාන නඩත්තු කටයුතු, පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම්


- රෝහල්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා රු. බිලියන **8.7**
- පළාත් රෝහල්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා රු. බිලියන **9.9**
- පළාත් සභා විෂය පථය යටතේ පවතින සෞඛ්‍ය ආශ්‍රිත වත්කම් නඩත්තු කිරීම සඳහා රු. බිලියන **3.8**
- ජෙව-වෛද්‍ය උපකරණ නඩත්තු කිරීම සඳහා රු. බිලියන **10.0**

ප්‍රධාන සුබසාධන වැඩසටහන්



ගර්භණී මව්වරුන් 265,000 කට පමණ පෝෂණීය ආහාර මල්ලක් ලබාදීම සඳහා

ත්‍රිපෝෂ වැඩසටහන සඳහා






සුවසැරිය ගිලන් රථ සේවාව සඳහා

විශ්‍රාමිකයන්ගේ අග්‍රහාර රක්ෂණාවරණය සඳහා




අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාවය හා විශිෂ්ටත්වය ළඟාකර ගැනීම



- 221,698 ක් පමණ වන ගුරු කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම තුළින් දිවයින පුරා පාසල් 10,191 ක ආසන්න වශයෙන් සිසුන් මිලියන 4.1 ක් වෙත ගුණාත්මක පාසල් අධ්‍යාපනයක් ලබා දීම.

- අධ්‍යයන කාර්ය මණ්ඩල 11,073 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් 12,877 ක පමණ පිරිසකගේ සහාය ඇතිව, රජයේ විශ්ව විද්‍යාල 19 ක් හරහා ආසන්න වශයෙන් උපාධිධාරීන් 173,118 ක් වෙත උසස් අධ්‍යාපනය ලබා දීම

- සිසුන් 110,000කට පමණ වෘත්තීය අධ්‍යාපනය ලබා දීම



රු. බිලියන 456.6
පාසල් අධ්‍යාපනය

පාසල් අධ්‍යාපනයට අදාළ කාර්ය මණ්ඩලය සඳහා පුද්ගල පඩිනඩි	- රු.බිලියන **316.6**
අ.පොෂ. සා/පෙළ, උ/පෙළ සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය ඇතුළු පාසල් විභාග පැවැත්වීම	- රු. බිලියන **8.9**
පිරිවෙන් අධ්‍යාපනය ලබා දීම	- රු. බිලියන **7.4**
උපකෘත පාසල් වෙත සහාය ලබා දීම	- රු. බිලියන **3.1**
තාක්ෂණ විෂය ධාරාව සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ස්ථාපනය කිරීම	- රු. බිලියන **2.5**
තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති	- රු. බිලියන **2.5**
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය	- රු. බිලියන **4.3**
ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන	- රු. බිලියන **2.4**
දැනට ක්‍රියාත්මකවන පාසල් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් කිරීම	- රු. බිලියන **7.92**

රු. බිලියන 135.3
විශ්වවිද්‍යාල අධ්‍යාපනය

විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි	- රු. බිලියන **60.5**
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	- රු. බිලියන **12.3**
සබරගමුව විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීම -	- රු. බිලියන **6.60**
නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම	- රු. බිලියන **2.4**
වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය	- රු. බිලියන **1.9**
රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ රසායනාගාර පහසුකම් සංවර්ධනය කිරීම	- රු. බිලියන **0.44**
කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපනය කිරීම	- රු. බිලියන **0.5**
රුහුණ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම	- රු. බිලියන **0.8**
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සඳහා රජයේ හිමිකම් දායකත්වය	- රු. බිලියන **8.4**
දකුණු ආසියානු තාක්ෂණික සහ වෛද්‍ය ආයතනය සඳහා රජයේ හිමිකම් දායකත්වය	- රු. බිලියන **2.9**
විශ්ව විද්‍යාලවල සංවර්ධන කටයුතු	- රු. බිලියන **10.5**

රු. බිලියන 15.4
වෘත්තීය අධ්‍යාපනය

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපනය කිරීම (වැඩ අවසන් කිරීමෙන් පසු ලබා දෙනු ලබන සහාය)	- රු. බිලියන **0.49**
තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණුවට අදාළ වෘත්තීය වේදිකා ව්‍යාපෘතිය	- රු. බිලියන **0.31**
ස්වයං රැකියා ප්‍රවර්ධන ප්‍රවේශය වැඩසටහන	- රු. බිලියන **0.35**
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය	- රු. බිලියන **1.8**
ලංකා ජර්මානු තාක්ෂණික ආයතනය	- රු. බිලියන **0.75**
වෘත්තීය පුහුණු අධිකාරිය	- රු. බිලියන **2.2**

රු. බිලියන 1.3
දහම් පාසල් අධ්‍යාපනය

සියලු ආගම්වල දහම් පාසල් වෙත පහසුකම් සැලසීම	- රු. බිලියන **0.6**
විභාග සහ තරඟ ඇතුළු සියලු ආගමික දහම් පාසල් ක්‍රියාකාරකම්	- රු. බිලියන **0.14**


ප්‍රධාන නඩත්තු, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම්

සාමාන්‍ය අධ්‍යාපනය



- පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම - රු. බිලියන **1.2**
- පළාත් සභා යටතේ පවතින පාසල් සම්බන්ධිත වත්කම් නඩත්තු කිරීම - රු. බිලියන **5.7**
- පළාත් සභා යටතේ පවතින පාසල් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - රු. බිලියන **9.1**
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - රු. බිලියන **1.0**
- ගුරු විද්‍යාල සහ මධ්‍යස්ථාන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - රු. බිලියන **0.40**
- ද්විතීයික අධ්‍යාපනය සඳහා පාසල් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - රු. බිලියන **2.79**

වෘත්තීය අධ්‍යාපනය



- තාක්ෂණ විද්‍යාල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් - රු. බිලියන **0.03**
- තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණු කටයුතු සම්බන්ධ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම - රු. බිලියන **0.04**
- තාක්ෂණ විද්‍යාපීඨ/තාක්ෂණික විද්‍යාල 7ක් නවීකරණය කිරීම - රු. බිලියන **0.50**
- නිපුණතා සංවර්ධනය, වෘත්තීය අධ්‍යාපන පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම - රු. බිලියන **0.056**

වෙනත්

- ග්‍රහලෝකාගාරය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම - රු. බිලියන **0.23**



ප්‍රධාන සුබසාධන වැඩසටහන්

රු. බිලියන 11.5
පාසල්, වෘත්තීය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර වෙනුවෙන් සහනාධාර ලබාදීම

රු. බිලියන 0.23
ක්‍රීඩා පාසල් වෙත පෝෂ්‍යදායී ආහාර ලබාදීම



නිපුණතා සිසු දිරිය ශිෂ්‍යවත් වැඩසටහන
රු. බිලියන 0.7

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි සිසුන් සඳහා වන ණය යෝජනා ක්‍රමය
රු. බිලියන 2.78



රු. බිලියන 32.1
පාසල් පෝෂණ ආහාර වැඩසටහන



රු. බිලියන 0.02
වෙනත් රටවල් හා එක්ව සිදු කරනු ලබන ශිෂ්‍යත්ව අධ්‍යාපන වැඩසටහන්

පාසල් නිල ඇඳුම්
රු. බිලියන 6.4



විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර
රු. බිලියන 4.6

රු. බිලියන 2.5
දුෂ්කර හා අති දුෂ්කර පාසල් සහ පිරිවෙන්වල සිසුන් වෙත සපත්තු ලබාදීම



රු. බිලියන 0.15
දහම් පාසල් පෙළපොත් මුද්‍රණය

ශිෂ්‍යාවන් වෙත සනීපාරක්ෂක තුවා ලබාදීම
රු. බිලියන 1.4



සියලු ආගම්වල දහම් පාසල් ගුරුවරුන් හට පහසුකම් සැලසීම
රු. බිලියන 0.94



රු. බිලියන 15.5
පාසල් පෙළපොත් මුද්‍රණය



රු. බිලියන 0.95
පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අභිමානී දීමනා

ශිෂ්‍යාධාර (5 වසර ශිෂ්‍යත්වය)
රු. බිලියන 0.95



පෙර පාසල් දරුවන් හට උදෑසන ආහාර ලබාදීම
රු. බිලියන 3.2



ආරක්ෂිත,
කාර්යක්ෂම,
පරිසර හිතකාමී සහ
තිරසාර ප්‍රවාහන සේවයක්



- ජාතික මාර්ග ජාලයේ කි.මී. 12,500ක්, පළාත් මාර්ග කි.මී. 12,800ක් සහ දිවයින පුරා විහිදී ඇති ග්‍රාමීය මාර්ග කි.මී. 100,000ක් පමණ සහ ඒ ආශ්‍රිත අනෙකුත් මාර්ග යටිතල පහසුකම් නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- අධිවේගී මාර්ග කි.මී.50ක් පමණ ඉදිකිරීම.
- දිනපතා දුම්රිය වාර 320ක් පමණ ධාවනය කිරීම, දුම්රිය මාර්ග කි.මී. 1,550 ක් පමණ, දුම්රිය සංඥා සහ දුම්රිය ඇණිය නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- කන්කසන්තුරෙයි වරාය සහ හිඟුරක්ගොඩ ගුවන් තොටුපල සංවර්ධනය කිරීම.
- ලංගම බස් ඇණිය නඩත්තු කිරීම.

2025 වර්ෂය සඳහා රු. බිලියන 483

පුනරාවර්තන වියදම් රු. බිලියන 49.2

ප්‍රාග්ධන වියදම් රු. බිලියන 433.7

රු. බිලියන 355.74
මූලධන රු. බිලියන - 347.20
පුනරාවර්තන රු. බිලියන - 8.49
මාර්ග

රු. බිලියන 21.85
පාලම්

රු. බිලියන 73.90
මූලධන රු. බිලියන - 42.52
පුනරාවර්තන රු. බිලියන - 31.38
දුම්රිය

රු. බිලියන 22.55
මූලධන රු. බිලියන - 14.08
පුනරාවර්තන රු. බිලියන - 8.46
ප්‍රවාහන

රු. බිලියන 8.87
මූලධන රු. බිලියන - 7.99
පුනරාවර්තන රු. බිලියන - 0.87
වරාය සහ ගුවන් තොටුපල

ප්‍රධාන වියදම් සංරචක

රු. බිලියන 355.70
මූලධන රු. බිලියන - 347.20
පුනරාවර්තන රු. බිලියන - 8.49

මාර්ග

ඉඟුරුකඩේ හන්දියේ සිට වරාය නගරය දක්වා කි.මී. 5.3ක් දිග වරාය ප්‍රවේශ කුළුණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	- රු. බිලියන **23.9**
කඩවත සිට මීරිගම දක්වා වන මධ්‍යම අධිවේගී මාර්ගයේ පලමු අදියර	- රු. බිලියන **81.3**
කඩවත අන්තර් හුවමාරු පද්ධතිය සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ පලමු අදියර හි මීරිගම දෙසට මාර්ග මී. 500ක් ඉදි කිරීම සඳහා	- රු. බිලියන **5.0**
වරාය ප්‍රවේශ කුළුණු මතින් ඉදිවන අධිවේගී මාර්ගයට ප්‍රවේශ වීමට පිටකොටුව සහ අළුත්මාවත අන්තර් හුවමාරුවල ඉදිකිරීම	- රු. බිලියන **4.5**
පොතුහැර සිට රඹුක්කන දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර 3	- රු. බිලියන **34.0**
අම්පාර උහන මාර්ගය ප්‍රතිසංස්කරණය (කි.මී. 33+000 – 45+000 සහ කි.මී. 45+000-58+780) සහ චෙන්කලඩි හන්දිය වැඩිදියුණු කිරීම	- රු. බිලියන **1.2**
හෝමාගම-ගොඩගම මාර්ග කොටස, කූරච්චන්කර්නි පාලම, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ 4/1 පාලම ඉදිකිරීම	- රු. බිලියන **2.30**
බිබිල ලුණුගල මාර්ගය සහ බෙරගල වැල්ලවාය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ බදුල්ල බිබිල මාර්ගයේ බෑවුම් ආරක්ෂණය	- රු. බිලියන **1.50**
කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	- රු. බිලියන **1.80**
මාර්ග තදබදය පහසු කිරීමට සහ අධිවේගී මාර්ග හා ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශ වීමට ඇති විකල්ප මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ අතැති බිල්පත් නිරවුල් කිරීම සහ ඉතිරි මාර්ග කොටස් වල තීරණාත්මක කාර්යයන් නිම කිරීම	- රු. බිලියන **15.0**
ග්‍රාමීය මාර්ග සංවර්ධනය	- රු. බිලියන **4.0**
A17 මාර්ගය (රක්වාන සූරියකන්ද කොටස) ප්‍රතිසංස්කරණය කිරීම සහ වල්ගම- දියගම මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීම	- රු. බිලියන **3.7**
මාර්ග සහ පාලම් ඉදිකිරීමට අත්පත්කරගත් ඉඩම්වලට වන්දි ගෙවීම	- රු. බිලියන **9.5**
පළාත් සභා යටතේ ඇති මාර්ග ආශ්‍රිත වත්කම් නඩත්තු කිරීම	- රු. බිලියන **8.9**
පළාත් සභා යටතේ ඇති මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	- රු. බිලියන **10.3**
රත්නපුර, මාතලේ, අනුරාධපුර, කුරුණෑගල, මොනරාගල, පුත්තලම, හම්බන්තොට, කළුතර, මඩකලපුව, කොළඹ, පොළොන්නරුව, ගාල්ල, මහනුවර, මාතර සහ උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05ක ග්‍රාමීය මාර්ග කි.මී. 1000ක් සංවර්ධනය කිරීම	- රු. බිලියන **18.0**
මාර්ග ඉදිකිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගත් ණය ගෙවීම	- රු. බිලියන **66.5**

රු. බිලියන 21.85

පාලම්



කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම	- රු. බිලියන **10.9**
උත්තරානන්ද මාවත සහ කොම්පඤ්ඤ වීදිය දුම්රිය ස්ථානය අසල දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම	- රු. බිලියන **2.5**
දිවයින පුරා ඇති ග්‍රාමීය පාලම් ඉදිකිරීම	- රු. බිලියන **1.5**
පැරණි පාලම් කොටස් උපයෝගී කරගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම (පාලම් 40ක් පමණ)	- රු. බිලියන **1.0**
යටියන්තොට මාගම්මන මාර්ගයේ ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය	- රු. බිලියන **0.3**

රු. බිලියන 73.90

මූලධන රු. බිලියන - 42.52

පුනරාවර්තන රු. බිලියන - 31.3

දුම්රිය



කැළණි දුම්රිය පාලම ප්‍රතිස්ථාපනය කිරීම	- රු. බිලියන **1.2**
ප්‍රසම්පාදනය කරන ලද දුම්රිය එන්ජින් 10ක්, ඩීසල් දුම්රිය බලවේග කට්ටල 06 ක්, ට්‍රැක් වැගන් 20 ක් සහ ටැංකි වැගන් 30 කට ගෙවීම	- රු. බිලියන **1.35**
ප්‍රසම්පාදනය කරන ලද දුම්රිය මැදිරි 160කට ගෙවීම් සඳහා සහ රත්මලාන වැඩපළ වැඩිදියුණු කිරීම, පොල්ගහවෙල - කුරුණෑගල දක්වා දුම්රිය මාර්ග පද්ධතිය ද්විත්ව මාර්ග පද්ධතියක් කිරීම, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ මහව සිට ඕමන්ත දක්වා සංඥා පද්ධතිය ස්ථාපනය කිරීම	- රු. බිලියන **8.0**
කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් දුම්රිය සේවා සඳහා විද්‍යුත් ටිකට්පත් ක්‍රමය හඳුන්වාදීම, මරදානේ දුම්රිය පාලන මධ්‍යස්ථානයක් ඉදිකිරීම, රත්මලාන දුම්රිය වැඩපළ ප්‍රතිසංස්කරණය කිරීම	- රු. බිලියන **11.5**
දුම්රිය ධාවනය සඳහා ඉන්ධන මිල දී ගැනීම	- රු. බිලියන **15.0**

රු. බිලියන 22.55

මූලධන රු. බිලියන - 14.08

පුනරාවර්තන රු. බිලියන - 8.46

ප්‍රවාහන



ලංගම සඳහා ප්‍රසම්පාදනය කළ බස්රථ 600 ක් සඳහා ගෙවීම. රියදුරු	- රු. බිලියන **3.0**
රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම	- රු. බිලියන **1.2**
මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම	- රු. බිලියන **7.7**
E - මෝටරින් ව්‍යාපෘතිය	- රු. බිලියන **0.85**
මාර්ග නීති කඩකිරීම් පාලනය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.	- රු. බිලියන **0.5**

රු. බිලියන 8.87

මූලධන රු. බිලියන - 7.99

පුනරාවර්තන රු. බිලියන - 0.87

වරාය සහ ගුවන් තොටුපල



හිඟුරක්ගොඩ ගුවන් තොටුපල සංවර්ධනය කිරීම.	- රු. බිලියන **1.2**
කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අදියර II හි බටහිර බහාලුම් පර්යන්තය II සඳහා බටහිර දියකඩනය දිගු කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සැකසීම.	- රු. බිලියන **0.5**
කන්කසන්තුරෙයි වරාය ප්‍රතිසංස්කරණය කිරීම	- රු. බිලියන **3.45**

ප්‍රධාන නඩත්තු, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම්


මාර්ග

කි.මී. 12,500 පමණ වන ජාතික මාර්ග ජාලය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	- රු. බිලියන **31.5**
ජාතික මාර්ග ජාලයෙහි තෝරාගත් කොටස් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම	- රු. බිලියන **12.0**
පළාත් සභා විෂය පථයට අයත්වන මාර්ග නඩත්තු කිරීම	- රු. බිලියන **8.1**
පළාත් මාර්ග ජාලය පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම	- රු. බිලියන **10.3**



පාලම්

ජාතික මාර්ග ජාලයෙහි හානි වූ සහ දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම	- රු. බිලියන **4.3**



දුම්රිය මාර්ග

නව රේල් පීලි සහ සිල්පර සමඟ දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම	- රු. බිලියන **3.4**
දුම්රිය බලඇණිය, දුම්රිය මාර්ග සහ සංඥා පද්ධතිය සංවර්ධනය කිරීම	- රු. බිලියන **12.2**
දුම්රිය බලඇණිය, දුම්රිය මාර්ග සහ සංඥා පද්ධතිය පුනරුත්ථාපනය කිරීම	- රු. බිලියන **0.25**



ප්‍රධාන සුබසාධන වැඩසටහන්

රු. බිලියන 2.2

සමාජීය වශයෙන් අත්‍යාවශ්‍ය බස්සේවා (සිසු සැරිය, ගැමිසැරිය, නිසිසැරිය සහ රාත්‍රී බස් සේවාවන්) සඳහා දායකත්වය.

රු. බිලියන 2.0

ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ගවල කි.මී 275,000 ක පමණ දෛනිකව ලංගම බස්රථ. 1,500ක් යෙදවීම.

යහපත් සුවපහසු දිවියක් ගත කිරීමේ අපේක්ෂාවට සහාය වීම



- මධ්‍ය කාලීනව, නව නල ජල සැපයුම් සබඳතා **මිලියනයක්** පමණ ලබා දීම
- දැනට පවතින ජල සැපයුම් යෝජනා ක්‍රම **342** ක පමණ ආධාරයෙන් **මිලියන 3.1** ක නිවාස, කර්මාන්ත සහ වෙනත් ආයතන සඳහා අඛණ්ඩව සුරක්ෂිත පානීය නල ජලය ලබා දීම තහවුරු කිරීම
- දිවයින පුරා ප්‍රජා ජල සැපයුම් යෝජනා ක්‍රම **3,780** ක පමණ තිරසාරභාවය සහතික කිරීම
- අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර 2025 වර්ෂය තුළ නිවාස ඒකක **16,570** ක පමණ ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම
- මුළු දිවයිනම ආවරණය වන පරිදි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

2025 වර්ෂය සඳහා රු. බිලියන 190

පුනරාවර්තන වියදම් රු. බිලියන 11

ප්‍රාග්ධන වියදම් රු. බිලියන 179.3

රු. බිලියන 108.7
පුනරාවර්තන රු. බිලියන - 0.82
ප්‍රාග්ධන රු. බිලියන - 107.9
පානීය ජල සැපයුම

රු. බිලියන 39.2
පුනරාවර්තන රු. බිලියන - 1.8
ප්‍රාග්ධන රු. බිලියන - 37.4
නිවාස

රු. බිලියන 25.1
ප්‍රාග්ධන රු. බිලියන - 25.1
ග්‍රාමීය සංවර්ධනය

රු. බිලියන 11.5
පුනරාවර්තන රු. බිලියන - 7.1
ප්‍රාග්ධන රු. බිලියන - 4.4
තරුණ සහ ක්‍රීඩා කටයුතු

රු. බිලියන 5.7
පුනරාවර්තන රු. බිලියන - 1.2
ප්‍රාග්ධන රු. බිලියන - 4.5
නාගරික සංවර්ධනය

ප්‍රධාන වියදම් සංරචක

රු. බිලියන 108.7
පුනරාවර්තන රු. බිලියන - 0.82
ප්‍රාග්ධන රු. බිලියන - 107.9
පානීය ජල සැපයුම

මුලතිව්, කිලිනොච්චි, බදුල්ල, මොනරාගල, රත්නපුර, කෑගල්ල, නුවරඑළිය, මාතර, කුරුණෑගල, ගම්පහ, මාතලේ යන දිස්ත්‍රික්කවල ජල සැපයුම සහ සනීපාරක්ෂා කටයුතු වැඩිදියුණු කිරීම	- රු. බිලියන **2.3**
යාපනය කිලිනොච්චි ජල සම්පාදන සහ සනීපාරක්ෂා කටයුතු ව්‍යාපෘතිය	- රු. බිලියන **5.4**
රුවන්වැල්ල සහ ඒ අවට ප්‍රදේශය වෙත නල ජල පහසුකම් සැපයීම	- රු. බිලියන **3.7**
පාතදුම්බර, පූජාපිටිය, අකුරණ, හාරිස්පත්තුව, ගඟවට කෝරළේ සහ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස (මහනුවර උතුර සහ පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය) සඳහා නල ජලය සැපයීම	- රු. බිලියන **7.5**
පදවිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, හොරොව්පතාන සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස (අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 11) සඳහා නල ජලය සැපයීම	- රු. බිලියන **6.4**
බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ ජල සැපයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම, සුරක්ෂිත පානීය ජලය සැපයීම සහ දෙහිවල සහ මොරටුව ජල සම්පාදන ජාල වැඩිදියුණු කිරීම (කළු ගඟ ජල සැපයුම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) -	- රු. බිලියන **5.5**
අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීමේ සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ ව්‍යාපෘතිය	- රු. බිලියන **3.4**
නව ජල සබඳතා ලබා දීම සඳහා පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමවල ධාරිතාව පුළුල් කිරීම	- රු. බිලියන **9.3**
ප්‍රජා ජල සැපයුම් යෝජනා ක්‍රම වල තිරසාර බව සහතික කිරීම	- රු. බිලියන **2.7**
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රජයේ හිමිකම් දායකත්වය	- රු. බිලියන **38.0**

රු. බිලියන 39.2
පුනරාවර්තන රු. බිලියන - 1.8
ප්‍රාග්ධන රු. බිලියන - 37.4
නිවාස

කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස ප්‍රතිස්ථානගත කිරීම සඳහා නාගරික පුනර්ජීවන වැඩසටහන	- රු. බිලියන **18.0**
කොළඹ තදාසන්න ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පුද්ගලයින් හට දැරිය හැකි පිරිවැයකට නිවාස ලබා දීම	- රු. බිලියන **7.0**
ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීම / ඔවුන් වෙත ස්ථිර නිවාස ලබා දීම	- රු. බිලියන **3.5**
වතු ජනතාව හට නිවාස ලබා දීම	- රු. බිලියන **4.6**

රු. බිලියන 25.1
ප්‍රාග්ධන රු. බිලියන - 25.1
ග්‍රාමීය සංවර්ධනය

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (උතුරු පළාත, නැගෙනහිර පළාත, උතුරු මැද පළාත සහ ඌව පළාත)	- රු. බිලියන **6.0**
ප්‍රජාවන් වෙත ප්‍රතිචාරාත්මක සහ වගවිය හැකි ආකාරයකින් සේවා සැපයීමට සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට හැකිවන පරිදි පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම	- රු. බිලියන **1.5**
ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට දායක වන අයුරින් පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම (නිර්ණායක පදනම් වූ ප්‍රදාන)	- රු. බිලියන **6.3**

වයඹ, ඌව, උතුර සහ නැගෙනහිර පළාත් ක්‍රීඩා සංකීර්ණ හතරක් ඉදිකිරීම	- රු. බිලියන **0.88**
මන්නාරම, පොළොන්නරුව, කළුතර, ගාල්ල, මාතර යන ප්‍රදේශවල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 5 ක් ඉදිකිරීම	- රු. බිලියන **0.44**
පාසල් සහ පිට පළාත් ක්‍රිකට් ක්‍රීඩා සංවර්ධනය කිරීම	- රු. බිලියන **0.1**
ජාත්‍යන්තර සහ ජාතික ක්‍රීඩා තරඟ	- රු. බිලියන **0.7**
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	- රු. බිලියන **1.0**
ජාතික යොවුන් සේනාංකය	- රු. බිලියන **1.63**
ජාතික තරුණ සේවා සභාව	- රු. බිලියන **2.26**


රු. බිලියන 11.5
පුනරාවර්තන රු. බිලියන - 7.1
ප්‍රාග්ධන රු. බිලියන - 4.4
තරුණ සහ ක්‍රීඩා කටයුතු

නගර 100 ක (සියක් නගර) නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධනය සිදු කිරීම	- රු. බිලියන **1.8**
යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම	- රු. බිලියන **0.4**
ක්‍රමෝපායික නගර සංවර්ධනය- අනුරාධපුරය	- රු. බිලියන **1.29**
ක්‍රමෝපායික නගර සංවර්ධනය - යාපනය	- රු. බිලියන **0.17**
නැගෙනහිර, බස්නාහිර පළාත් සහ හම්බන්තොට දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම	- රු. බිලියන **0.25**

රු. බිලියන 5.7
පුනරාවර්තන රු. බිලියන - 1.2
ප්‍රාග්ධන රු. බිලියන - 4.5
නාගරික සංවර්ධනය

ප්‍රධාන නඩත්තු, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම්

රු. බිලියන 0.25
නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය



ප්‍රධාන සුබසාධන වැඩසටහන්

රු. බිලියන 0.4

ජාතික ක්‍රීඩා සංසද සඳහා ක්‍රියාත්මක වන අඛණ්ඩ පෝෂණ වැඩසටහ



රටෙහි ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම සඳහා ඵලදායී, නවීකරණය කරන ලද තිරසාර කෘෂිකර්මයක්



2025 වර්ෂය සඳහා රු. බිලියන 254

පුනරාවර්තන වියදම්
රු. බිලියන 99.3

ප්‍රාග්ධන වියදම්
රු. බිලියන 154.5



රු. බිලියන 124.4
පුනරාවර්තන රු. බිලියන - 67.6
ප්‍රාග්ධන රු. බිලියන - 56.8
කෘෂිකර්මය



රු. බිලියන 11.4
පුනරාවර්තන රු. බිලියන - 6.2
ප්‍රාග්ධන රු. බිලියන - 5.2
ධීවර



රු. බිලියන 89.5
පුනරාවර්තන රු. බිලියන - 11.4
ප්‍රාග්ධන රු. බිලියන - 78.1
වාරිමාර්ග



රු. බිලියන 13.7
පුනරාවර්තන රු. බිලියන - 7.7
ප්‍රාග්ධන රු. බිලියන - 6.0
ඉඩම්



රු. බිලියන 3.5
පුනරාවර්තන රු. බිලියන - 0.9
ප්‍රාග්ධන රු. බිලියන - 2.6
පශු සම්පත්



රු. බිලියන 11.3
පුනරාවර්තන රු. බිලියන - 5.4
ප්‍රාග්ධන රු. බිලියන - 5.9
වැවිලි කර්මාන්ත

ප්‍රධාන වියදම් අයිතම



රු. බිලියන 124.4
පුනරාවර්තන රු. බිලියන - 67.6
ප්‍රාග්ධන රු. බිලියන - 56.8
කෘෂිකර්මය

ආහාර සහන වැඩසටහන (ලෝක ආහාර වැඩසටහන)	- රු. බිලියන **1.8**
දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ කෘෂි ව්‍යවසායකයින් බල ගැන්වීම, වැව් සහ එල්ලංගා පද්ධති ඉදි කිරීම	- රු. බිලියන **8.7**
කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමේ කාර්යයන් සිදු කිරීම සහ කෘෂි ව්‍යවසායකයින් බල ගැන්වීම	- රු. බිලියන **3.4**
කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය යටතේ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමේ කාර්යයන් සිදු කිරීම සහ කෘෂි ව්‍යවසායකයින් බල ගැන්වීම	- රු. බිලියන **5.9**
ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීම් වැඩසටහන	- රු. බිලියන **1.2**
කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ ගොවි සමාගම් ඇති කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම, කෘෂි උද්‍යාන නිර්මාණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය	- රු බිලියන **1.2**
කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන	- රු. බිලියන **0.6**
වී අලෙවි මණ්ඩලයේ ණය නැවත ගෙවීම	- රු. බිලියන **2.7**

මහවැලි ජල සුරක්ෂිතතා වැඩසටහන යටතේ උතුරු මැද ඇළ මාර්ගය සහ වයඹ මහ ඇළ මාර්ගය ඉදි කිරීම, මිණිපේ වම් ඉවුර පිළිසකර කිරීම, ජල සම්පත් කළමනාකරණය	- රු. බිලියන **32.5**
මහවැලි අධිකාරිය හරහා වේලි ආරක්ෂණ අලුත්වැඩියාව හා ආකෘති සහ ඇළ මාර්ග නඩත්තු කිරීම	- රු. බිලියන **3.6**
පහළ මල්වතු ඔය ආශ්‍රිත බහු අංශ සංවර්ධන ව්‍යාපෘතිය	- රු. බිලියන **5.0**
සුළු වාරිමාර්ග, ග්‍රාමීය වැව් එල්ලංගා පද්ධති සහ අත්හැර දමන ලද කුඹුරු ඉඩම් සංවර්ධනය	- රු. බිලියන **3.5**
ශ්‍රී ලංකාවේ අවදානම් සහිත ගංගා නිම්නවල, ජලාධාර ප්‍රදේශවල සහ නකල්ස් කඳු පද්ධතියේ පෝෂක ප්‍රදේශවල පහළ ජල මාර්ගවල සිටින යැපුම් කෘෂිකර්මයේ නියුතු ගොවීන්ගේ සහ කෘෂි වැවිලි ප්‍රජාවන් තුළ දේශගුණයට ඔරොත්තු දීම ශක්තිමත් කිරීම	- රු. බිලියන **2.4**
දේශගුණයට ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය යටතේ කැළණි ගංගා නිම්නයේ ගංවතුර කළමනාකරණය, කාලගුණ විද්‍යා පද්ධතිය නවීකරණය කිරීම, ආපදා සඳහා පූර්ව සූදානම සහ ක්‍රියාකාරී සූදානම, ගංවතුර පුරෝකථනය වැඩිදියුණු කිරීම සහ නායයෑම් පුරෝකථනය වැඩිදියුණු කිරීම	- රු. බිලියන **9.0**
උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය	- රු. බිලියන **1.9**
යාන් ඔය ව්‍යාපෘතිය	- රු. බිලියන **2.3**
ඇල්ලේ වැව ජලාශය	- රු. බිලියන **1.0**
එරුවැව සිට මහකන්දරාව ජලාශය දක්වා ඇළ මාර්ගය ඉදි කිරීම -	- රු. බිලියන **0.5**
ගුරුත්ව වාරිමාර්ග කාර්යයන්	- රු. බිලියන **1.8**

රු. බිලියන 89.5
පුනරාවර්තන රු. බිලියන - 11.4
ප්‍රාග්ධන රු. බිලියන - 78.1
වාරිමාර්ග

ගන්දර ධීවර වරාය ඉදි කිරීම	- රු. බිලියන **3.7**
කලපු සංවර්ධනය සහ සංරක්ෂණය	- රු. බිලියන **0.1**
මයිලිඩි ධීවර වරාය සංවර්ධනය	- රු. බිලියන **0.2**
උතුරු කලාපයේ ධීවර කර්මාන්තය සංවර්ධනය	- රු. බිලියන **0.28**

රු. බිලියන 11.4
පුනරාවර්තන රු. බිලියන - 6.2
ප්‍රාග්ධන රු. බිලියන - 5.2
ධීවර

කුරුඳු කර්මාන්තය යළි පණ ගැන්වීම සඳහා ගොවීන්ට සහාය වීම	- රු. බිලියන **0.1**
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණෙන් සංවර්ධන කටයුතු හා අලෙවිකරණ කටයුතු කිරීම, ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධන කටයුතු	- රු. බිලියන **0.8**
පොල් නිෂ්පාදනය සහ කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ සිදුකරනු ලබන සංවර්ධන කටයුතු	- රු. බිලියන **0.79**
කෘෂි නවීකරණ ව්‍යාපෘතිය යටතේ කෘෂි අගය දාම වර්ධනය	- රු. බිලියන **0.27**
වැවිලි ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය	- රු. බිලියන **1.8**
කුරුඳු ප්‍රවර්ධන වැඩසටහන (Cinnamon Gate)	- රු. බිලියන **0.27**

රු. බිලියන 11.3
පුනරාවර්තන රු. බිලියන - 5.4
ප්‍රාග්ධන රු. බිලියන - 5.9
වැවිලි කර්මාන්ත

රජයේ කටයුතු වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම	- රු. බිලියන **4.0**
බිම් සවිය වැඩසටහන	- රු. බිලියන **1.0**

රු. බිලියන 13.7
පුනරාවර්තන රු. බිලියන - 7.7
ප්‍රාග්ධන රු. බිලියන - 6.0
ඉඩම්

රු. බිලියන 3.5

පුනරාවර්තන රු. බිලියන - 0.9

ප්‍රාග්ධන රු. බිලියන - 2.6

පශු සම්පත්

මහවැලි අධිකාරිය මගින් සිදුකරනු ලබන පශු සම්පත් වැඩසටහන්	- රු. බිලියන **1.4**
අභිජනනය ඉහළ නැංවීම තුළින් දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම	- රු. බිලියන **0.1**
කුඩා හා මධ්‍යම පරිමාණයේ පශු සම්පත් සංවර්ධනය	- රු. බිලියන **0.25**
එළුවන් ඇති කිරීම හරහා ජීවනෝපාය සංවර්ධනය	- රු. බිලියන **0.2**

ප්‍රධාන සුබසාධන වැඩසටහන්

රු. බිලියන 35.0



රසායනික සහ කාබනික පොහොර සම්බන්ධ පොහොර සහනාධාර වැඩසටහන



රු. බිලියන 5.6

ගොවි විශ්‍රාම වැටුප්

රු. බිලියන 1.0



අපනයන බෝග සංවර්ධනය වෙනුවෙන් ගොවීන්ට සහාය වීම

රු. බිලියන 1.5

බෝග රක්ෂණය වෙනුවෙන් රජයේ දායකත්වය

රු. බිලියන 0.5



රබර් සඳහා සහනාධාර



රු. බිලියන 0.1

ලංකාවේ කුරුඳු කර්මාන්තය නැවත පණ ගැන්වීම සඳහා ගොවීන්ට සහාය වීම

රු. බිලියන 3.0



ධීවර කර්මාන්තය නැවත පණ ගැන්වීම සඳහා මූල්‍යමය සහාය

ප්‍රධාන නඩත්තු, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම් කටයුතු

රු. බිලියන 22.0



ප්‍රධාන පර්යේෂණ

රු. බිලියන 9.7





රු. බිලියන 22.0
ප්‍රධාන නඩත්තු, පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම් කටයුතු

තෝරාගත් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමවල අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු	- රු. බිලියන **4.0**
පළාත් වාරිමාර්ග නඩත්තුව	- රු. බිලියන **2.03**
පළාත් සභා යටතේ කෘෂිකර්මය, වාරිමාර්ග, පශු සම්පත් සහ මිරිදිය ධීවර කටයුතු ආශ්‍රිත පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්	- රු. බිලියන **12.5**



රු. බිලියන 9.7
ප්‍රධාන පර්යේෂණ

ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීම් වැඩසටහන	- රු. බිලියන **1.2**
කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන	- රු. බිලියන **0.6**
වැවිලි ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු	- රු. බිලියන **0.5**
රබර් පර්යේෂණ ආයතනය	- රු. බිලියන **0.49**
තේ පර්යේෂණ ආයතනය	- රු. බිලියන **0.7**
පොල් පර්යේෂණ ආයතනය	- රු. බිලියන **0.45**
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ පර්යේෂණ කටයුතු	- රු. බිලියන **0.1**
පශු සම්පත් අභිජනන ව්‍යාපෘතිය	- රු. බිලියන **0.2**
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම	- රු. බිලියන **0.1**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු ආයතනය මගින් සිදු කරන සමාජ සහ ආර්ථික පර්යේෂණ	- රු. බිලියන **0.2**
දේශගුණික සුහුරු වාරිමාර්ග කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය යටතේ වන පර්යේෂණ	- රු. බිලියන **2.5**



සදාහරිත ජීවිතයක් සඳහා සහාය දීම



- පවතින විදුලි වැටවල කි.මී. 1,456කට ආසන්න දුර ප්‍රමාණයක් (කි.මී. 5,611ක් වන මුළු දුර ප්‍රමාණයෙන්) අලුත්වැඩියා කිරීම
- ප්‍රතිස්ථාපිත කරන ලද වනාන්තර නඩත්තුව (හෙක්. 136.5) , වාණිජමය වන වගා ස්ථාපනය කිරීම (හෙක්. 800), පැළ වගාවන් නඩත්තුව (හෙක්. 1,474) සහ වනාන්තරවල සීමා මායිම් සලකුණු කිරීම (කි.මී. 1,500)
- රක්ෂිත ප්‍රදේශවල ඇති ආක්‍රමණික ශාක ඉවත් කිරීම සහ තෘණභූමි කළමනාකරණය
- වසර 2030 වනවිට හයිඩ්‍රෝක්ලෝරෝෆ්ලෝරෝකාබන් කාණ්ඩයේ රසායන ද්‍රව්‍ය ආනයනය තහනම් කිරීමට අදාළ මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම
- දිවයින පුරා පළාත් පාලන ආයතන මගින් ඝන අපද්‍රව්‍ය කාර්යක්ෂමව කළමනාකරණය කිරීම
- මහනුවර සහ තදාසන්න ප්‍රදේශ, රත්මලාන, මොරටුව, කැලණිය, ගාල්ල, පෑලියගොඩ සහ කොළඹ නාගරික සීමාව සඳහා නල අපජල පහසුකම් බැහැර කිරීමේ පහසුකම් සැලසීම

2025 වර්ෂය සඳහා රු. බිලියන 44

පුනරාවර්තන වියදම් රු. බිලියන 12.9

ප්‍රාග්ධන වියදම් රු. බිලියන 31.39



රු. බිලියන 0.80
වෙරළ ආරක්ෂණය



රු. බිලියන 8.95
ආපදා කළමනාකරණය



රු. බිලියන 7.26
පරිසර සංරක්ෂණය



රු. බිලියන 2.70
වැසි ජල කළමනාකරණය



රු. බිලියන 4.99
අපද්‍රව්‍ය කළමනාකරණය



රු. බිලියන 5.92
වන ජීවී සංරක්ෂණය



රු. බිලියන 13.6
අපජලය කළමනාකරණය

ප්‍රධාන වියදම් සංරචක



රු. බිලියන 8.95
ආපදා කළමනාකරණය

ආපදා බලපෑම අවම කර ගැනීම සඳහා ආපදා අවම කිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	- රු. බිලියන **0.30**
නායයෑම් තර්ජන සහ නායයෑම් හේතුවෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම	- රු. බිලියන **0.50**
ආපදා තත්වයන් හේතුවෙන් අවතැන් වූ ජනතාව සඳහා දිස්ත්‍රික් සුරක්ෂා මධ්‍යස්ථාන ඇති කිරීම	- රු. බිලියන **0.05**
ගංවතුර සහ නායයෑම් බලපෑමට ලක්වූ ප්‍රදේශවල පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු	- රු. බිලියන **1.00**
නායයෑම් පිළිබඳ විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු	- රු. බිලියන **0.08**
නායයෑම් අවම කිරීමේ වැඩසටහන්	- රු. බිලියන **0.12**
ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීම	- රු. බිලියන **3.83**
ඩොප්ලර් කාලගුණ රේඩාර් පද්ධති	- රු. බිලියන **1.00**



රු. බිලියන 7.26
පරිසර සංරක්ෂණය

මොන්ට්‍රියල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම	- රු. බිලියන **0.05**
කෘෂිකර්මය, වන සම්පත් සහ අනෙකුත් භූමි පරිහරණ ක්ෂේත්‍ර සඳහා පුළුල් පාරදෘශ්‍ය රාමුවක් වැඩි දියුණු කිරීම වෙනුවෙන්	- රු. බිලියන **0.10**
ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ඉඩම් තිරසාර ලෙස කළමනාකරණය හා ජෛව විවිධත්වය ඒකාබද්ධ කිරීමේ සහයෝගිතාවය හා නව්‍ය මූල්‍යකරණය	- රු. බිලියන **0.06**
දේශගුණික විපර්යාසවල වැඩිවන බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අවධානමට ලක්විය හැකි ප්‍රජාවන් ශක්තිමත් කිරීම	- රු. බිලියන **0.10**
ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිත කරන කාබනික දූෂක සහිත පලිබෝධනාශක සහ සෞඛ්‍ය අංශයේ භාවිත කරන රසදිය සහ අපද්‍රව්‍ය සමෝධානිකව කළමනාකරණය කිරීම සහ පරිසර හිතකාමී අයුරින් බැහැර කිරීම	- රු. බිලියන **0.06**
වන ආවරණය පුළුල් කිරීම	- රු. බිලියන **1.00**



රු. බිලියන 4.99
අපද්‍රව්‍ය කළමනාකරණය

